# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 55 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திகதி<br>Date | 12/01/2024<br>පැය 1735 | | |

## මාධ්‍ය නිවේදනය

### මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන 118 ජාතික සේවා මැදිරිය නවීකරණය කිරීම සහ සේවාවන් පුළුල් කිරීම සම්බන්ධව.

2004 වසරේ ආරම්භකර මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්වා ගෙන යනු ලබන 118 ජාතික සේවා මැදිරිය වර්තමාන මහජන ආරක්ෂක අමාත්‍යතුමාගේ සංකල්පයක් පරිදි මහජනතාව වෙත වඩාත් පුළුල් හා කාර්යක්ෂම සේවාවක් ලබා දීමේ අරමුණින් මේ වන විට නවීකරණය කර ඇත.

ගාස්තු අය නොකරන 118 කෙටි දුරකථන අංකයට අමතරව https://118.pubsec.gov.lk දරණ වෙබ් අඩවිය මඟින් අන්තර්ජාලය භාවිතා කරමින් පැය 24 පුරාම මහජනතාවට පහත කරුණු සම්බන්ධයෙන් තොරතුරු ලබා දිය හැක .

- ජාතික ආරක්ෂාවට සෘජුවම හෝ වක්‍රාකාරයෙන් තර්ජනයක් විය හැකි ත්‍රස්තවාදී හා අන්තවාදී ක්‍රියාකාරකම් පිළිබඳව.
- මත්ද්‍රව්‍ය ජාවාරම්, නීති විරෝධී මත්පැන් හා විෂ මත්ද්‍රව්‍ය පිළිබඳව.
- සංවිධානාත්මක අපරාධ කල්ලි හා එම ක්‍රියාකාරකම්, සැකකටයුතු හෝ අවශ්‍ය කරනු ලබන පුද්ගලයින් පිළිබඳව.
- ශරීරය හා දේපල සම්බන්ධ අපරාධ සිදු වීම පිළිබඳ තොරතුරු හා එම අපරාධ සඳහා අවශ්‍ය කරනු ලබන සැකකරුවන් පිළිබඳව.
- ළමුන් හා කාන්තාවන්ට අදාලව සිදුවන වැරදි, අපයෝජන පිළිබඳව.
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සිදුවන අකටයුතුකම් හා නොසලකා හැරීම් පිළිබඳව.
- ස්වභාවික විපත් හා ආපදා පිළිබඳව.
- පොලිස් නිලධාරීන් විසින් සිදු කරනු ලබන වැරදි, දූෂිත ක්‍රියා හා අක්‍රමිකතා පිළිබඳව.

- මහජන ආරක්ෂක අමාත්‍යාංශය විෂය පථයට අයත් වන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා ආගමන විගමන දෙපාර්තමේන්තුවට අදාල නිලධාරීන්ගේ දූෂිත ක්‍රියා හා අක්‍රමිකතාවයන් පිළිබඳව.

ඉහත කරුණු වලට අදාලව ලැබෙන පැමිණිලි මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ඍජු අධීක්ෂණය යටතේ විමර්ශනය හා ක්‍රියාත්මක කිරීම සඳහා අදාල ආයතන සහ නිලධාරීන් වෙත යොමු කර පසු විපරම් කර එහි ප්‍රගතිය පිළිබඳව පැමිණිලිකරුවන් දැනුවත් කරනු ඇත. එසේම මෙම අංකය වෙත තොරතුරු ලබා දෙන පුද්ගලයින්ගේ අනන්‍යතාවය සහ තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කරන අතර වඩාත් ඵලදායී සේවාවක් ලබා දීම සඳහා ලැබෙන ඇමතුම් පටිගත වනු ඇත.

තවද මෙම සේවාව අවභාවිතා කිරීමෙන් වලකින ලෙසටත්, තම පුද්ගලික අභිමථාර්තයන් සඳහා සහ හිතාමතාම තවත් පුද්ගලයෙකු හෝ පාර්ශවයක් අපහසුතාවයට පත් කිරීමේ අරමුණින් අසත්‍ය පැමිණිලි ඉදිරිපත් කරනු ලබන පුද්ගලයන්ට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කරන බවට මහජන ආරක්ෂක අමාත්‍යාංශය මඟින් දැනුම් දී ඇත .